සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

**ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I**
**கிறிஸ்தவ நாகரிகம் I**
**Christian Civilization I**

**49 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ජුදා ශිෂ්ටාචාරය කෙරෙහි බලපෑ පෙරදිග (ආසියානු) ශිෂ්ටාචාර වන්නේ
(1) ග්‍රීක, බැබිලෝනියානු සහ සුමේරියානු ශිෂ්ටාචාර ය.
(2) රෝම, සුමේරියානු සහ මෙසොපොතේමියානු ශිෂ්ටාචාර ය.
(3) ඇසිරියානු, සුමේරියානු සහ ග්‍රීක ශිෂ්ටාචාර ය.
(4) ඇසිරියානු, බැබිලෝනියානු සහ සුමේරියානු ශිෂ්ටාචාර ය.
(5) ඊජිප්තියානු, සුමේරියානු සහ ග්‍රීක ශිෂ්ටාචාර ය.

**2.** යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගා නිම්න ශිෂ්ටාචාර සම්බන්ධයෙන් **නො ගැළපෙන** වැකිය තෝරන්න.
(1) රජතුමාට පාලනය කිරීමට බලය දෙවියන් වහන්සේ විසින් දී ඇති බව මෙහි ජනයා විශ්වාස කළහ.
(2) පාලනය සඳහා අවශ්‍ය මුදල් බදු අය කිරීම මගින් සපයා ගන්නා ලදී.
(3) පළමුවරට කෘෂි භාවිතය ඇරඹුණේ මෙම ශිෂ්ටාචාරයෙනි.
(4) සිහින අර්ථ නිරූපණය කිරීමේ පුරුද්දක් මෙහි ජනයා අතර තිබිණි.
(5) භූමිතෙල්, රටඉඳි සහ අත්තික්කා ගෙඩි ඖෂධ ලෙස යොදා ගන්නා ලදී.

**3.** ජුදා සංස්කෘතිය කෙරෙහි බලපෑ ග්‍රීක සංස්කෘතික අංග වන්නේ
(1) පරිපාලනය, ආගමික වතාවත් හා කළමනාකරණයයි.
(2) දර්ශනවාදය, සාහිත්‍යය හා ගණිතයයි.
(3) ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව හා චිත්‍ර කලාවයි.
(4) ගොවිතැන, සත්ත්ව පාලනය හා කෘෂි භාවිතයයි.
(5) ආගමික වතාවත්, ගෘහ නිර්මාණ ශිල්පය හා මූර්ති කලාවයි.

**4.** පිලිස්තියෙහි පිහිටි නගරයක් **නො වන්නේ**
(1) අස්කෙලොන් ය. (2) අෂ්දොද් ය. (3) ගාසා ය. (4) එක්රොන් ය. (5) ජෙරිකෝ ය.

**5.** ඉදොම් රාජ්‍යය බැබිලෝනිය විසින් ආක්‍රමණය කළ වසර කුමක් ද?
(1) ක්‍රි.පූ. 315 (2) ක්‍රි.පූ. 333 (3) ක්‍රි.පූ. 587 (4) ක්‍රි.පූ. 597 (5) ක්‍රි.පූ. 604

**6.** දාවිත් රජතුමා අභිෂේක කරන ලද්දේ
(1) සාමුවෙල් විසිනි. (2) ජෙස්සේ විසිනි. (3) සාවුල් විසිනි.
(4) එලි විසිනි. (5) මෙල්කිසදෙක් විසිනි.

**7.** ක්‍රි.පූ. 315 දී ටොලමි රජතුමාට ජෙරුසලම් නගරය අල්ලා ගැනීමට හැකි වූයේ
(1) අසිරියානුවන් ආධාර කළ නිසා ය.
(2) මහා ඇලෙක්සැන්ඩර් රජතුමාගේ මරණය නිසා ඇති වූ දේශපාලන අස්ථාවරභාවය නිසා ය.
(3) ඇන්ටියෝකස් ඒපිපානුස්ගේ මරණය නිසා ඇති වූ දේශපාලන අස්ථාවරභාවය නිසා ය.
(4) රෝමවරුන්ගේ මැදිහත් වීම නිසා ය.
(5) පලස්තීන ජාතිකයන් දියත් කළ කැරැල්ල නිසා ය.

**8.** ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී ජුදා සමාජයේ ගෘහයක ප්‍රධානියා වූ පියෙකුට හිමි වූ වගකීමක් **නො වන්නේ** කුමක් ද?
(1) තම කෙතෙහි හොඳ බීජ වැපිරීම (2) සොරුන්ගෙන් දේපළ ආරක්ෂා කිරීම
(3) තම නිවෙස්වල පාස්කු බැටලුවා පූජා කිරීම (4) සේවකයන්ට කාර්ය පැවරීම
(5) බදු ගෙවීම

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

**9.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් 'නික්මයාම' සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඊශ්‍රායෙල්වරු වහලුන් වශයෙන් ඊජිප්තුවේ ජීවත් වූහ.
(2) ඊශ්‍රායෙල්වරුන්ගේ විමුක්ති අරගලයේ දී මෝසෙස්තුමා එයට නායකත්වය සපයන ලදී.
(3) නික්මයාම සිදු වූ අවධියේ දී පාරාවෝ රජතුමා ජෝශප් ගැන කිසිවක් දැන සිටියේ නැත.
(4) ඊශ්‍රායෙල්වරු ගලීල මුහුද තරණය කර කාන්තාරය වෙත පැමිණියහ.
(5) ඔවුහු පාස්කු භෝජනය අනුභව කිරීමෙන් පසු ඊජිප්තුවෙන් පිටව ගියහ.

**10.** ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් වැකි සලකා බලන්න.
A - රජතුමාගේ නම සහ ගුණාංග ගිවිසුමේ හැඳින්වීමට ඇතුළත් විය.
B - විටින් විට එම ගිවිසුම දේව මාලිගාවේ දී කියවන ලදී.
C - ජෙරමියා 31 : 31 - 33 වගන්තිවල සඳහන් ගිවිසුම ද්විපාර්ශ්වික ගිවිසුමකි.
D - ගිවිසුමට සාක්ෂිකරුවන් වශයෙන් දෙවිවරුන් රාශියකගේ නාමාවලියක් ඇතුළත් කරන ලදී.
E - ගිවිසුම ඇති කරන ලද්දේ ආගමික සිද්ධි සම්බන්ධයෙන් පමණි.
ගිවිසුම සම්බන්ධයෙන් ඉහත සඳහන් වැකි අතුරෙන් නිවැරදි ඒවා මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**11.** අස්ථානගත වී තිබූ 'ඩිඩකේ' නමැති ග්‍රන්ථය නැවත හමු වූයේ
(1) ක්‍රි.ව. 4 වන සියවසේ දී ය.
(2) ක්‍රි.ව. 5 වන සියවසේ දී ය.
(3) ක්‍රි.ව. 6 වන සියවසේ දී ය.
(4) ක්‍රි.ව. 18 වන සියවසේ දී ය.
(5) ක්‍රි.ව. 19 වන සියවසේ දී ය.

**12.** ක්‍රිස්තියානුවෝ මුලින් ම නිරාහාර සීලය රක්ෂා කරන ලද්දේ,
(1) සිකුරාදා දිනවල දී ය.
(2) සෙනසුරාදා දිනවල දී ය.
(3) චතාරික දින 40 තුළ දී ය.
(4) බදාදා සහ සිකුරාදා දිනවල දී ය.
(5) ආගමන සමයේ දී සහ චතාරික සමයේ දී ය.

**13.** ජෙරුසලම් දේව මාලිගයේ පූජක තනතුරට පත් කරන ලද්දේ
(1) ලෙවී ගෝත්‍රයේ ආරොන් වංශිකයන් අතුරෙනි.
(2) ලෙවී ගෝත්‍රයේ ජාකොබ් වංශිකයන් අතුරෙනි.
(3) ජුදා ගෝත්‍රයේ කුමාරවරුන් අතුරෙනි.
(4) බෙන්ජමින් ගෝත්‍රිකයන් අතුරෙනි.
(5) ලෙවී ගෝත්‍රයේ අවිවාහක පිරිමින් අතුරෙනි.

**14.** ජේසුස් වහන්සේ ජීවත් වූ සමයේ ජුදා සමාජයේ උසස් පන්තිවලට අයත් වූයේ කවුද?
(1) සදිසිවරු හා සෙලෙට්වරු
(2) එසේනිවරු හා සෙලෙට්වරු
(3) සදිසිවරු හා පරිසිවරු
(4) එසේනිවරු හා පරිසිවරු
(5) පරිසිවරු හා සෙලෙට්වරු

**15.** ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්කම ගැන සඳහන් ශුද්ධ ලියවිලි පාඨය අඩංගු වන්නේ කවරක ද?
(1) 1 තෙසලෝනි 5 : 1-10
(2) පිලිප්පි 2 : 5-11
(3) රෝම 6 : 3-9
(4) එපේසි 1 : 3-10
(5) එපේසි 2 : 5-11

**16.** 'කතෝලික සභාව' යන්න පළමුව භාවිත කළේ
(1) ශාන්ත ජස්ටින්තුමා ය.
(2) ශාන්ත අයිරේනියස්තුමා ය.
(3) අන්තියෝකියේ ශාන්ත ඩයොනීශියස්තුමා ය.
(4) අන්තියෝකියේ ශාන්ත ඉග්නේශියස්තුමා ය.
(5) ශාන්ත පීලික්ස්තුමා ය.

**17.** ධර්මෝපදේශයට ඉතා වැදගත් තැනක් පිරිනමමින් 1551, 1556 සහ 1558 යන වසරවල දී ධර්මෝපදේශ ග්‍රන්ථ සම්පාදනය කර ප්‍රකාශයට පත් කළ තැනැත්තා වන්නේ
(1) ශාන්ත චාල්ස් බොරොමියෝතුමා ය.
(2) ශාන්ත පිලිප් නේරිතුමා ය.
(3) ශාන්ත පීටර් කැනීෂියස්තුමා ය.
(4) ශාන්ත ෆ්‍රැන්සිස් ද සාලෙස්තුමා ය.
(5) ශාන්ත විසෙන්ති ද පාවුලුතුමා ය.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

**18.** පහත සඳහන් වැකි සලකා බලන්න.

A - ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව 1570 දී ඉතාලියේ දී පවත්වන ලදී.
B - ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව හේතු කොටගෙන සභාව තුළ එකමුතුකම ඇති විය.
C - මන්ත්‍රණ සභාව පැවැත්වීමේ මූලික හේතුව වූයේ සභාවේ ධර්මතා පහදා දීමයි.
D - සභාව තුළ ම නවෝදයක් ඇති කිරීම මන්ත්‍රණ සභාව කැඳවීමේ එක් අරමුණක් විය.
E - සභාවේ සදාචාරය හා ධර්මිෂ්ඨභාවය නංවාලීම මන්ත්‍රණ සභාවේ තවත් අරමුණක් විය.

ඉහත සඳහන් ඒවායින් ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව පිළිබඳ නිවැරදි වැකි වන්නේ

(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**19.** පහත සඳහන් වැකි සලකා බලන්න.

A - චීනයේ කතෝලික ධර්මය ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් මැතිව් රිච් පියතුමා වැදගත් තැනක් උසුලයි.
B - චීනයේ කතෝලික ධර්මයේ පසුබෑම සම්බන්ධයෙන් රෝමයේ සභා නායකයන් වගකිව යුතු නැත.
C - ධර්මදානය සඳහා දේශීයකරණය අත්‍යවශ්‍ය ම නොවේ.
D - ක්‍රි.ව. 1700 දී 300 000 කට වඩා අධික චීන ජාතිකයන් පිරිසක් කතෝලික ධර්මය වැළඳ ගත්හ.
E - ක්‍රි.ව.1615 දී V වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා චීන භාෂාවෙන් දේව වන්දනා මෙහෙයක් පැවැත්වීමට අවසර දුන්නේ ය.

ඉහත සඳහන් ඒවායින් චීනයේ කතෝලික ධර්මය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, D සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**20.** ශුද්ධ වූ ජුසේ වාස්තුමා භාග්‍යවන්ත ධූරයට ඔසවනු ලැබුයේ

(1) 1990 දී ය. (2) 1994 දී ය. (3) 1995 දී ය. (4) 2000 දී ය. (5) 2015 දී ය.

**21.** ශුද්ධ වූ ජුසේ වාස්තුමාට තම ධර්මදූත කටයුතුවල දී උපකාරී වූ සිංහල බෞද්ධ රජවරුන් වන්නේ

(1) II වන විමලධර්සූරිය රජතුමා සහ II වන රාජසිංහ රජතුමා ය.
(2) මායාදුන්නේ රජතුමා සහ නරේන්ද්‍රසිංහ රජතුමා ය.
(3) II වන විමලධර්මසූරිය රජතුමා සහ නරේන්ද්‍රසිංහ රජතුමා ය.
(4) II වන රාජසිංහ රජතුමා සහ මායාදුන්නේ රජතුමා ය.
(5) මායාදුන්නේ රජතුමා සහ VII වන භුවනෙකබාහු රජතුමා ය.

**22.** 'වේදභේදවලට විරුද්ධ' (Against Hereses) නමැති ග්‍රන්ථය සම්පාදනය කරන ලද්දේ

(1) ශාන්ත නසියන්සියන්හි ග්‍රෙගරිතුමා විසිනි. (2) ශාන්ත බැසිල්තුමා විසිනි.
(3) ශාන්ත ඇතනේශියස්තුමා විසිනි. (4) ශාන්ත අම්බ්‍රෝස්තුමා විසිනි.
(5) ශාන්ත අයිරේනියස්තුමා විසිනි.

**23.** ශාන්ත අම්බ්‍රෝස්තුමා ක්‍රිස්තියානි ධර්මය වැළඳ ගැනීමට පෙර වැළඳගෙන සිටි වේදභේදය වන්නේ

(1) ඒරියානුවාදයයි. (2) මැනිකියානුවාදයයි. (3) ඩොනටියානුවාදයයි.
(4) පෙලාගියානුවාදයයි. (5) නෙස්ටෝරියානුවාදයයි.

**24.** ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කිරීමට පුරෝගාමී වූ ශුද්ධෝත්තම පියතුමා වන්නේ

(1) ඩැමස්කස් ශුද්ධෝත්තම පියතුමා ය. (2) II වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.
(3) බොනිෆස් ශුද්ධෝත්තම පියතුමා ය. (4) II වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා ය.
(5) II වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා ය.

**25.** මධ්‍යගත යුගයේ දී (ක්‍රි.ව. 800 -1500) සමාජයේ ආගමික භක්තිය බොහෝ දුරට පිරිහී ගොස් ආධ්‍යාත්මික වර්ධනයේ පසුබෑමක් ඇති වීමට හේතු වූයේ

(1) සභා නායකයෝ බොහෝ දුරට කුරුස යුද්ධවල නියැලී සිටීම ය.
(2) පූජාප්‍රසාදිවරු මුදල් සහ දේපළ උපයා ගැනීමට වඩාත් නැඹුරු වී සිටීම ය.
(3) සභාවට විරුද්ධව කැරලි ගැසීමට සමහර පූජාප්‍රසාදිවරු ජනතාව පෙලඹවීම ය.
(4) නූගත් ජනතාවට ආගම ධර්මය ඉගැන්වීමට පූජාප්‍රසාදිවරු අසමත් වීම ය.
(5) සභාවේ පාලනය කෙරෙහි දේශපාලන නායකයෝ අත පෙවීම ය.

**26.** ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කිරීමට අවශ්‍ය වූයේ

(1) ලතින් භාෂාව පරිපාලන භාෂාව වීම නිසා ය.
(2) ලතින් භාෂාව දේව වන්දනාවට යොදා ගත් භාෂාව වීම නිසා ය.
(3) ලතින් භාෂාව අනෙකුත් යුරෝපීය භාෂාවලට මුල් වූ භාෂාව වීම නිසා ය.
(4) සභා නීති මාලා සම්පාදනයට ලතින් භාෂාව යොදා ගැනීම නිසා ය.
(5) රෝම අධිරාජ්‍යය තුළ ලතින් භාෂාවේ බලපෑම ඉතා ඉහළ මට්ටමක පැවති නිසා ය.



Department of Examinations, Sri Lanka

**27.** පුරාණ යුරෝපීය ගෝත්‍ර පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - කෘෂිකර්මාන්තයෙහි හා සත්ත්ව පාලනයෙහි නිරත වීම
B - සෑම ගෝත්‍රයක් ම රජතුමකු යටතේ පාලනය විය
C - මනුෂ්‍ය නිදහස සහ ස්වයං ගෞරවය උසස් කොට සැලකිණි.
D - බොහෝ ගෝත්‍රයනට තමන්ට ම සතු හමුදාවක් තිබිණි.
E - උසස් අධ්‍යාපන මට්ටමක් පැවතිණි.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ඒවා වන්නේ

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**28.** ශුද්ධ වූ ජුසේ වාස්තුමන් පිළිබඳව පහත සඳහන් වැකි සලකා බලන්න.

A - ගෝවේ සිට පැමිණි ඔරතෝරියානු පූජකතුමෙකි.
B - ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලන සමයේ දී ජනතාවට සේවය කළ පියතුමෙකි.
C - ලන්දේසි පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ කතෝලික සභාව ආරක්ෂා කර දීමට පුරෝගාමී වූ පියතුමෙකි.
D - සිංහල භාෂාවෙන් ග්‍රන්ථ රාශියක් රචනා කළ විශාරදයෙකි.
E - දේශීය සභාවක් ගොඩනැගීමට පදනම දැමූ 'ශ්‍රී ලංකාවේ අපෝස්තුලුවරයා' යයි නම් ලත් අයෙකි.

ඉහත වැකි අතුරෙන් නිවැරදි ඒවා වන්නේ

(1) A, B සහ C ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**29.** පහත සඳහන් වැකි සලකා බලන්න.

A - එස්. ජී. පෙරේරා පියතුමා ශ්‍රී ලංකාවේ පළමු ජේසු නිකායික පූජකවරයා ය.
B - එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා සිංහල සාහිත්‍යය සහ ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි.
C - මර්සලින් ජයකොඩි පියතුමා ප්‍රසිද්ධ ලේඛකයෙකි.
D - පීටර් පිල්ලේ පියතුමා කලාව පිළිබඳ විශාරදයෙකි.
E - නල්ලූර් ස්වාමි ඥානප්‍රගාසර් දෙමළ සාහිත්‍යය සහ ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි.

ඉහත සඳහන් ඒවා අතුරෙන් නිවැරදි වැකි **නො වන්නේ,**

(1) A සහ B ය. (2) A සහ E ය. (3) B සහ C ය. (4) C සහ D ය. (5) D සහ E ය.

**30.** සභාව දයාවේ කටයුතුවල නිරත වීම අනිවාර්ය කටයුත්තක් වන්නේ

(1) එය පහසුවෙන් ක්‍රිස්තියානි ධර්මය පැතිරවීමට මඟක් වන හෙයිනි.
(2) එය ධර්මදූතවරුන්ගේ වගකීමක් වන හෙයිනි.
(3) එය දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කිරීමට මඟක් හා දේව රාජ්‍යයේ සලකුණක් වන හෙයිනි.
(4) මුල් සභාව ද දයාවේ කටයුතුවල නිරත වූ හෙයිනි.
(5) එය ක්‍රිස්තියානි නොවන්නන්ගේ අවධානය දිනා ගැනීමට හේතුවක් වන හෙයිනි.

**31.** විදේශීය ධර්මදූතවරුන් විසින් ශ්‍රී ලංකාව තුළ ඉටු කළ සේවා අතුරෙන් වැදගත් ම සේවා තුනක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) අධ්‍යාපන, තාක්ෂණික අධ්‍යාපන හා ආරෝග්‍යශාලා සේවා
(2) ආරෝග්‍යශාලා, ධර්මදූතික හා තාක්ෂණික අධ්‍යාපන සේවා
(3) අධ්‍යාපන, ආරෝග්‍යශාලා හා ධර්මදූතික සේවා
(4) ධර්මදූතික, අනාථයන් රැක බලා ගැනීම හා තරුණ සේවා
(5) අනාථයන් රැක බලා ගැනීම, තාක්ෂණික අධ්‍යාපන හා ළමා සේවා

**32.** පහත සඳහන් ඒවා අතුරෙන් බෙනඩික්තානු තාපස නිකායේ ලක්ෂණයක් **නො වන්නේ**

(1) යාඥාව සහ වැඩ කිරීමයි.
(2) ශුද්ධ ලියවිල්ල සහ ලතින් භාෂාව හා සාහිත්‍යය ඉගැන්වීමයි.
(3) තාපසාරාම අසල අධ්‍යාපන ආයතන පිහිටුවීමයි.
(4) පැරණි ශුද්ධ ලියවිලි අනුපිටපත් කිරීමයි.
(5) කුඩා කුටිවලට වී තනිව යාච්ඤා කිරීමයි.

**33.** යාචක නිකායන් පිළිබඳ ව පහත සඳහන් වැකි සැලකිල්ලට ගන්න.

A - සභාව තුළට සුවිශේෂිත දිළිඳුකම නැවත ගෙන ඒම
B - කුරුස යුද්ධ නිසා භක්ති අභ්‍යාස අතහැර දැමීම
C - යුරෝපයට ධනය ගලා ඒම නිසා ලෞකිකත්වය වර්ධනය වීම
D - ජනතාව නව පැවිදි නිකායන් බිහිවනු දැකීමට කැමති වීම
E - එවකට පැවති පැවිදි පන්ති කාලයට නොගැළපෙන බවක් පෙනී යාම

ඉහත දක්වා ඇති ඒවා අතුරෙන් යාචක නිකායන් බිහි වීමට හේතු දැක්වෙන ප්‍රකාශ වන්නේ

(1) A, B සහ C ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

**34.** ෆ්‍රැන්සිස්කන් පැවිදි ජීවිත ක්‍රමයට ඇතුළත් **නො වන්නේ** කුමක් ද?
(1) චාම් ජීවිතයක් ගත කිරීම
(2) පෞද්ගලික ධනයක් අයිතිකර නොගැනීම
(3) දිනපතා ආහාරය සිඟමනෙන් ලබා ගැනීම
(4) ගොවිපලවල් පාලනය කිරීම
(5) සුවිශේෂක දිළිඳුකම අනුව ජීවත්වීම

**35.** තෙයියාර්ඩ් ඩි ෂාර්ඩැන්
(1) පූජකවරයෙක්, දර්ශනවාදියෙක් සහ ඉතිහාසඥයෙකි.
(2) මානව පාෂාණීභූත විද්‍යාඥයෙක්, දර්ශනවාදියෙක් සහ භූ විද්‍යාඥයෙකි.
(3) භූ විද්‍යාඥයෙක්, ඉතිහාසඥයෙක් සහ සාහිත්‍ය විශාරදයෙකි.
(4) පූජකවරයෙක්, දේවධර්ම ශාස්ත්‍රඥයෙක් සහ සාහිත්‍ය විශාරදයෙකි.
(5) දේවධර්ම ශාස්ත්‍රඥයෙක්, මානව පාෂාණීභූත විද්‍යාඥයෙක් සහ ඉතිහාසඥයෙකි.

**36.** දේව වන්දනාවට පොලිෆනි සංගීත ක්‍රමය පළමුවෙන් හඳුන්වා දුන්නේ
(1) ඉතාලියේ දී ය. (2) ප්‍රංශයේ දී ය. (3) ජර්මනියේ දී ය. (4) ග්‍රීසියේ දී ය. (5) එංගලන්තයේ දී ය.

**37.** ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ ශිල්පය බිහි වූ අවධිය වන්නේ
(1) ක්‍රිස්තියානි ධර්මයට ආගමික නිදහස ලබා දුන් අවධියයි.
(2) කොන්ස්තන්තිනෝපල් නගරය රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ අවධියයි.
(3) රෝම අධිරාජ්‍යය බිහි වූ අවධියයි.
(4) ක්‍රිස්තියානි ධර්මය ප්‍රංශයට හඳුන්වා දුන් අවධියයි.
(5) මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයා රජ කළ අවධියයි.

**38.** මීගමුව ශාන්ත මරියා දේවස්ථානයේ බයිබලීය චිත්‍ර අඳින ලද කලාකරුවා වන්නේ
(1) පෝල් නවරත්න ය. (2) හෙන්ඩ්‍රිකස් ය. (3) ඩේවිඩ් පේන්ටර් ය.
(4) එන්. එස්. ගොඩමාන්න ය. (5) රිචඩ් ගේබ්‍රියල් ය.

**39.** දේශීය නාට්‍ය කලාව බිහි කිරීමට දායකත්වය ලබා දුන් දූවේ පාස්කු නාට්‍ය ආභාසය ලැබුයේ
(1) ජර්මනියේ ඔබර්මගවු පාස්කු නාට්‍ය ආශ්‍රයෙනි.
(2) දේශීය කෝලම් නාට්‍ය සම්ප්‍රදාය ආශ්‍රයෙනි.
(3) ස්පාඤ්ඤයේ සහ පෘතුගාලයේ ආගමික නාට්‍ය සම්ප්‍රදාය ආශ්‍රයෙනි.
(4) ගෝවේ ආගමික නාට්‍ය සම්ප්‍රදාය ආශ්‍රයෙනි.
(5) දකුණු ඉන්දීය නාට්‍ය සම්ප්‍රදාය ආශ්‍රයෙනි.

**40.** පහත සඳහන් ඒවායින් කතෝලික සභාවේ සමාජ ඉගැන්වීම්වල අඩංගු වී **නොමැති** කරුණ තෝරන්න.
(1) සමාජ හා ආර්ථික ජීවිතයේ කේන්ද්‍රය මනුෂ්‍යයා විය යුතු ය.
(2) තාක්ෂණික හා වෘත්තීයමය ප්‍රගතිය මනුෂ්‍යයාගේ යහපත සඳහා විය යුතු ය.
(3) තමන් කරන කාර්යය මගින් ස්ව සංවර්ධනයක් ඇතිකර ගැනීමට සේවකයන්ට අවස්ථාවක් තිබිය යුතු ය.
(4) සේවකයන්ට තමන් කරන කාර්යයට සරිලන සාධාරණ වැටුපක් හිමි විය යුතු ය.
(5) පෞද්ගලික දේපළ ජනතා සන්තක කළ යුතු ය.

**41.** පවුල් ජීවිතයේ වටිනාකම් හා අරමුණු සම්බන්ධයෙන් වූ පහත සඳහන් කරුණු සලකා බලන්න.
A - ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර ප්‍රේමය
B - විවාහක ප්‍රේමය වර්ධනය වීම සඳහා දරුවන් වැඩියෙන් ලැබීම
C - පවුලේ එකමුතුකම වැඩීමට පවුල තුළ ස්වාමි පුරුෂයාගේ මූලිකත්වය පිළි ගැනීම
D - දරුවන් වෛවාහක ප්‍රේමයේ ඵලයක් ලෙස භාර ගැනීම
E - දරුවන්ට නිසි අධ්‍යාපන ලබා දීම දෙමව්පියන්ගේ වගකීමක් වීම
ඉහත සඳහන් ඒවා අතුරෙන් විවාහය සම්බන්ධයෙන් කතෝලික සභාවේ ඉගැන්වීම්වලට ඇතුළත් වන්නේ
(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**42.** පහත සඳහන් ඒවා අතුරෙන් ආසියානු රදගුරු සමුළු සම්මේලනයේ (FABC) ඉගැන්වීමට ඇතුළත් **නො වන** ක්‍රියාකාරකම කුමක් ද?
(1) II වන වතිකානු මන්ත්‍රණ සභාවේ ප්‍රතිපත්ති අනුකූලව, අපෝස්තලික සේවාව ආසියාවේ අවශ්‍යතා අනුව හැඩගැසීම
(2) මනුෂ්‍යයාගේ පූර්ණ සංවර්ධනය සඳහා දායක වීම
(3) ආසියාවේ සභා සහ ආසියාවේ රදගුරුවරුන් අතර සහයෝගිතාවක් ගොඩනැගීම
(4) පූජ්‍යප්‍රසාදීවරුන් පක්ෂ දේශපාලන ක්‍රියාකාරකම්වලට සහභාගී වීම ධෛර්යමත් කිරීම
(5) අන්තර් ආගමික සංවාද සහ ක්‍රිස්තියානි සභා එකමුතුව සඳහා ක්‍රියා කිරීම

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**43.** ලෝක කිතුනු සභා සම්මේලනයේ (WCC) පළමු රැස්වීම පවත්වන ලද්දේ
(1) නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් නගරයේ දී ය.
(2) ස්කොට්ලන්තයේ එඩින්බර්ග් නගරයේ දී ය.
(3) ඉන්දියාවේ කල්කටා නගරයේ දී ය.
(4) ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරයේ දී ය.
(5) බෙල්ජියමේ බ්‍රසල්ස් නගරයේ දී ය.

**44.** පහත සඳහන් ඒවායින් II වන වතිකානු මන්ත්‍රණ සභාව කැඳවීමට බල පෑ හේතුවක් **නොවූයේ** කුමක් ද?
(1) සභාව නූතන ලෝකයට යෝග්‍ය ලෙස සැකසීම
(2) සභාව තුළ ම නවෝදයක් ගෙන ඒම
(3) දේව ජනතාව ගොඩනැගීම
(4) භේදභේද හෙළා දැකීම
(5) ක්‍රිස්තියානි සභා අතර එකමුතුකම ප්‍රවර්ධනය කිරීම

**45.** පහත සඳහන් වගන්ති සලකා බලන්න.
A - විවාහයේ සහ පවුල් ජීවිතයේ ගරුත්වය අගය කිරීම
B - සමාජ හා ආර්ථික ජීවිතය නංවාලීම
C - දේව වන්දනා නවෝදයක් ඇති කිරීම
D - සංස්කෘතියේ සැබෑ සංවර්ධනයක් ඇති කිරීම
E - අධ්‍යාපනය නංවාලීම
ඉහත සඳහන් ඒවා අතුරෙන් නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභා ව්‍යවස්ථාවෙහි අඩංගු ප්‍රධාන තේමා තුන වන්නේ
(1) A, B සහ D ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**46.** පහත සඳහන් වගන්ති සැලකිල්ලට ගන්න.
A - ආසියාවේ සභා අතර සහයෝගිතාව වර්ධනය කිරීම
B - ආසියාවේ සභා එක්කොට එක් සභාවක් නිර්මාණය කිරීම
C - කිතුනු සභා තවදුරටත් බෙදීමෙන් වළකාලීම
D - දේශපාලන දර්ශන මුල්කොට ගෙන වෙන් වී ගිය සභා නැවත එක්සත් කිරීමට ප්‍රයත්න දැරීම
E - කතෝලික සභාව හා ඉවැන්ජලිකල් සභා ද එක්කර ගත හැකි ආකාරයට ක්‍රියාකාරකම් සැලසුම් කිරීම
ඉහත සඳහන් ඒවා අතුරෙන් ආසියානු කිතුනු සභා සම්මේලනයේ ඉගැන්වීම් නිරූපණය කරන වගන්ති වන්නේ
(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**47.** පහත සඳහන් වැකි සැලකිල්ලට ගන්න.
A - ක්‍රිස්තියානීන් අතර එකමුතුකම ක්‍රිස්තුන් වහන්සේ විසින් ම අභිප්‍රාය කළ දෙයකි.
B - ක්‍රිස්තියානි සභා භේද භින්න වීම වැරදි ආදර්ශයක් ගෙන දෙන්නකි.
C - කිතුනු එකමුතු ව්‍යාපාරයේ දී බලවත් සභාවලට ප්‍රමුඛස්ථානයක් දිය යුතු ය.
D - කිතුනු එකමුතුකමින් තොරව ශුභාරංචියට සාක්ෂි දැරිය නොහැකි ය.
E - ක්‍රිස්තියානි සභා එකමුතුකම සභාවේ පවතින විවිධත්වයට බාධාවකි.
ඉහත සඳහන් ඒවා අතුරෙන් ක්‍රිස්තියානි සභා එකමුතුව සම්බන්ධයෙන් නිවැරදි වගන්ති ලෙස සැලකිය හැක්කේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**48.** පහත සඳහන් ඒවායින් ශුද්ධ වූ අගුස්තිනුතුමා විසින් රචිත කෘති පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දේව නගරය, ක්‍රිස්තු අනුසාරය, ශුද්ධ වූ ත්‍රිත්වය
(2) දේව නගරය, ක්‍රිස්තු අනුසාරය, ආධ්‍යාත්මික ගීය
(3) දේව නගරය, ශුද්ධ වූ ත්‍රිත්වය , පාපෝච්චාරණය
(4) ක්‍රිස්තු අනුසාරය, ශුද්ධ වූ ත්‍රිත්වය, ආධ්‍යාත්මික ගීය
(5) ශුද්ධ වූ ත්‍රිත්වය, ආධ්‍යාත්මික ගීය, පාපෝච්චාරණය

**49.** පෘතුගීසි පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය නව මගකට යොමු වූයේ
(1) අත්දැකීම් සහිත පැවිදි පූජකවරු ගුරුවරුන් ලෙස ක්‍රියා කිරීම නිසා ය.
(2) ශ්‍රී ලංකාව තුළ බටහිර ක්‍රමයේ අධ්‍යාපනයක් හඳුන්වා දීම නිසා ය.
(3) මිසම් ආශ්‍රිත පාසල් බිහි වීම නිසා ය.
(4) පාසල් විෂයමාලාව තුළ ආගමික අධ්‍යාපනයට වැදගත් තැනක් හිමි වීම නිසා ය.
(5) කියවීම, ලිවීම, ගණිතය, ලතින් හා යහපත් පුරුදු වැනි ඒවා ඉගැන්වීම නිසා ය.

**50.** ශාන්ත අගුස්තීනුතුමා පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) සභාවේ විශිෂ්ටතම ලතින් සභා පීතෘවරයා ය.
(2) 'පාපෝච්චාරණය' නමැති ග්‍රන්ථයෙහි තම තරුණ දිවිය ගැන කරුණු සඳහන් කරයි.
(3) ජීවිතයේ එක් අවධියක දී මැනිකියානුවාදය පිළිගෙන සිටියේ ය.
(4) ග්‍රීක දර්ශනයට විරුද්ධව බොහෝ ග්‍රන්ථ සම්පාදනය කළේ ය.
(5) ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳව බොහෝ කරුණු ලියා ඇත.

* * *

Department of Examinations, Sri Lanka

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II**<br>கிறிஸ்தவ நாகரிகம் II<br>Christian Civilization II | **49 S II** | ***පැය තුනයි***<br>*மூன்று மணித்தியாலம்*<br>*Three hours* |

**උපදෙස් :**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) මධ්‍යතන යුගයේ දී සභාවේ නායකයෝ බොහෝ සේ ලෞකිකත්වයට නැඹුරු වී සිටි අතර අක්‍රමවත් ජීවිත ගත කළහ. එතුමන්ලාගේ ජීවිතයේ දක්නට ලැබුණු එවන් අක්‍රමිකතා **හතරක්** සඳහන් කරන්න.
   (ii) II වන වතිකානු මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන අතුරින් ඕනෑ ම ප්‍රකාශන **හතරක්** නම් කරන්න.
   (iii) ශ්‍රී ලංකාව තුළ කතෝලික ධර්මය ප්‍රචලිත කිරීම සඳහා පෘතුගීසි ධර්මදූතවරුන් විසින් භාවිත කළ ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.
   (iv) බ්‍රිතාන්‍ය පාලන සමයේ ප්‍රොතෙස්තන්ත්‍ර සභා මගින් ශ්‍රී ලංකාවේ ඉටු කළ සේවා **හතරක්** සඳහන් කරන්න.
   (v) ලතින් පිළිවෙත පිළිපදින සභා සහ පෙරදිග ඕර්තඩොක්ස් පිළිවෙත පිළිපදින සභා අතර දක්නට ලැබෙන සමාන ලක්ෂණ සහ වෙනස් ලක්ෂණ **දෙක** බැගින් ලියන්න.

2. (i) ඊශ්‍රායලයේ රාජකීය සංස්ථාව බිහි වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.
   (ii) දාවිත් රජුගේ පාලන සමයේ දී ඊශ්‍රායෙල් දේශයේ ඇති වූ සමාජ අභිවෘද්ධිය පිළිබඳ කරුණු **හතරක්** ලියන්න.
   (iii) ක්‍රිස්තු වර්ෂ පළමු ශත වර්ෂයේ දී ක්‍රිස්තියානි ධර්මය වැළඳගත් සමූහ තුළ සිදු වූ සමාජ වෙනස්කම් **හතරක්** දක්වන්න.
   (iv) ක්‍රිස්තු වර්ෂ හතරවන ශත වර්ෂය ආරම්භයත් සමග සභාව තුළ සිදු වූ වෙනස්කම් **හතරක්** සඳහන් කරන්න.
   (v) 21 වන සියවසේ දී ලෝක සාමය ඇති කරලීම සඳහා සභාව විසින් ගත යුතු ක්‍රියාමාර්ග **හතරක්** ලියන්න.

3. (i) අන්තියෝකියේ ගුරුකුලයේ ලක්ෂණ **හතරක්** ලියන්න.
   (ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිඳුන්ගේ ධර්මදූතික ක්‍රියාවලිය මගින් ශ්‍රී ලංකාවේ සභාවට ගත හැකි පාඩම් **හතරක්** සඳහන් කරන්න.
   (iii) රෝම ආගමික වතාවත්, කිතුනු දේව වන්දනාව කෙරෙහි බල පෑ ආකාරය පිළිබඳ කරුණු **හතරක්** සඳහන් කරන්න.
   (iv) දොමිනිකාන පැවිදි පන්තියෙන් සභාවට සිදු වූ සේවා **හතරක්** ලියන්න.
   (v) ශ්‍රී ලංකාවේ කලාවේ උන්නතිය සඳහා කිතුනුවන්ගෙන් ලැබුණු දායකත්වය පිළිබඳ නිදසුන් **හතරක්** ලියන්න.

## II කොටස

4. ක්‍රිස්තියානීන්ගේ විශ්වාසය සහ හැසිරීම පිළිබඳ කාරණාවල දී ඒවා නිසි ලෙස පැහැදිලි කරදීම මගින් ශුද්ධ වූ පාවුලුතුමා මුල් ක්‍රිස්තියානි සමූහයන් සුපෝෂණය කර ඇත.
   (i) "ක්‍රිස්තියානි පවුල ප්‍රේමය සහ එක්සත්කම වර්ධනය කර ගැනීමට යෝග්‍ය වූ ස්ථානයකි." පැහැදිලි කරන්න.
   (ii) ශුද්ධාත්මයාණන් විසින් ප්‍රදානය කරන ලද දීමනා එක් එක් ක්‍රිස්තියානි භක්තිකයා සුපෝෂණය කරන ආකාරය සාකච්ඡා කරන්න.
   (iii) මළවුන්ගේ උත්ථානය ශරීරාකාරව කෙරෙන උත්ථානයක් යන කිතුනු විශ්වාසය 1 කොරින්ති 15 පරිච්ඡේදයේ ඉගැන්වීම් ගුරුකොට ගනිමින් විස්තර කරන්න.
   (iv) "ක්‍රිස්තියානි නායකත්වය ක්‍රිස්තුන් වහන්සේගේ නායකත්වය මත ගොඩනැගී ඇත." මෙම කියමන ශුද්ධ වූ පාවුලුතුමාගේ ඉගැන්වීම් අනුව පැහැදිලි කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

5. යම් විශේෂ සංස්කෘතියක් පරිණාමනය වීමේ දී එය හා ගැටෙන අනෙකුත් සංස්කෘතිවල ලක්ෂණ එයට ඇතුළත් වෙයි.
   (i) යුප්‍රටීස්-ටයිග්‍රිස් ගංගා නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
   (ii) නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරය ජුදා සංස්කෘතිය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න.
   (iii) ජුදා සංස්කෘතිය කෙරෙහි ග්‍රීක සංස්කෘතිය බලපෑ ආකාරය පැහැදිලි කරන්න.
   (iv) ක්‍රිස්තියානි සංස්කෘතිය මගින් ශ්‍රී ලාංකික සංස්කෘතිය පෝෂණය වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

6. ධර්මදූතවරු ධර්මදානයේ දී සාර්ථක හා සුදුසු ක්‍රම භාවිත කළහ.
   (i) ධර්මදානයෙහි යෙදෙන්නන් ස්වදේශිකයන්ගේ භාෂා ප්‍රගුණ කිරීමේ ඇති යෝග්‍යතාව පැහැදිලි කරන්න.
   (ii) ක්‍රිස්තියානි ධර්මය සහ ක්‍රිස්තියානි කලාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පාස්කු නාට්‍යවලින් ඉටු වූ කාර්යභාරය විස්තර කරන්න.
   (iii) අධ්‍යාපනය ධර්මදානයේ දී උපයෝගී කරගත හැකි සාර්ථක මාර්ගයක් බව පැහැදිලි කරන්න.
   (iv) "ධර්මදානයේ දී මානුෂීය ආධාර ඉතා වැදගත් වේ." පැහැදිලි කරන්න.

7. සමාජ සහ ආධ්‍යාත්මික වර්ධනය සඳහා තාපස සහ පැවිදි නිකායන් මගින් අනුපමේය මෙහෙයක් ඉටු වී ඇත.
   (i) තාපස ක්‍රමය තුළ දක්නට ඇති ප්‍රධාන ලක්ෂණ මොනවා දැයි විස්තර කරන්න.
   (ii) යුරෝපීය සමාජය ගොඩනැගීමේ දී බෙනඩික්ටයින් තාපස ක්‍රමය මගින් සිදු වී ඇති සේවාව විස්තර කරන්න.
   (iii) සභාවේ ධර්මදූත සේවාව සම්බන්ධයෙන් ජේසු නිකායේ දායකත්වය පැහැදිලි කරන්න.
   (iv) ලෞකිකත්වය කරා ගමන් කරමින් සිටින සමාජයකට පැවිදි දිවිය මගින් සාක්ෂි දැරිය හැකි ආකාරය පැහැදිලි කරන්න.

8. සභාව, සමාජයේ සාමාජීය, සදාචාරික හා ආගමික අභිවෘද්ධිය සඳහා අධ්‍යාපනය මගින් බොහෝ සේ දායක වී ඇත.
   (i) "ක්‍රි.ව. 1050 සහ 1300 අතරතුර කාලයේ දී අධ්‍යාපනය සම්බන්ධයෙන් සභාව විවිධ සාධනීය වෙනස්කම් ක්‍රියාත්මක කරන ලදී." විමසන්න.
   (ii) පෘතුගීසි ධර්මදූතයන්ගේ පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයෙහි පැවති අඩුපාඩු මොනවා දැයි විස්තර කරන්න.
   (iii) ඉහත (ii) ට අදාළ ව ඔබ සඳහන් කළ අඩුපාඩු මකා දැමීම සඳහා පෘතුගීසි ධර්මදූතවරුන් ගත් ක්‍රියාමාර්ග මොනවා දැයි විස්තර කරන්න.
   (iv) ධර්මෝපදේශය ඉගැන්වීම කිතුනු ජීවිතයේ අඛණ්ඩ පුහුණුව සඳහා දායක වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka